පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සතිය - 02

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර කලාව

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.

**නිපුණතා මට්ටම :-** 2.2 විවිධ ස්වභාවික වස්තු හා ශාක කොටස් රේඛාවෙන් අඳියි.

**ක්‍රියාකාරකම :-** සිලින්ඩරාකාර හැඩයක් හා ශාකමය කොටස් රේඛාවෙන් අඳිමු.

**පියවර :-**

01. ඔබේ නිවසේ ඇති සිලින්ඩරාකාර වස්තුවක් ( වීදුරුවක්/ බෝතලයක්/ ජෑම් බෝතලයක්/ ජොග්ගුවක් ) සහ පත්‍ර 3 - 4 සහිත ක්‍රෝටන් / ජම්බු/ පේර/ අරලිය වැනි අතු රිකිල්ලක් සපයා ගන්න.

02. දැන් එම අතුරිකිල්ල පහත පරිදි සිලින්ඩරාකාර වස්තුවට දමන්න. එය ආධාරකයක් ( ඇස් මට්ටමට පහතින් ඇති මේසයක්/ ස්ටූල් එකක් ) මත තබන්න.










03. හොඳින් නිරීක්ෂණය කරන්න.

04. B පැන්සල්, ඇඳීමට අවශ්‍ය කොළ/ ඩ්‍රෝවින් පොත සපයාගන්න.



05. පහත ඇඳ ඇති රේඛා චිත්‍රය බලන්න.

06. ඔබ කලින් රේඛා සිතුවම් ඇඳ ඇති පරිද්දෙන් ඉහත පරිදි ඔබ විසින් සපයාගත් ද්‍රව්‍ය දෙස බලා රේඛාවෙන් ද්‍රව්‍ය සංරචනය කරන්න.